# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1998 අංක 42 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජුලි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුලි මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි.

තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 42 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූලි මස 28 වන දින]

එල්. ඩී.-ඕ. 26/97.

**ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 42 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** 1993 අංක 16 දරන පනතින් අවසන් වරට සංශෝධිත, මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, ආගාමික හා විගාමික පනතේ 45 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- — 351 වන අධිකාරයේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " වරදකරු කරනු ලැබීමෙන් පසු " යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන වෙනුවට " වරදකරු කරනු ලැබීමෙන් පසු, (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, එක් අවුරුද්දකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පනස් දහසකට නොඅඩු හා රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට සහ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය හෝ (ඒ) ඡේදය හෝ (ඔ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ (ග) ඡේදය හෝ (ච) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, මාස හයකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමට සහ රුපියල් පනස් දහසකට නොඅඩු හා රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තිය අගට, පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :-

" (6) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන්ව තිබුණ ද, (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන්, කවර හෝ අධිකරණයක් ඉදිරියේ-

2-D 048938 — 5,900 (98/05)

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ පනතේ 303 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය ;

(ආ) වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු බවට තීරණය කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(අ) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතේ වූ සෑම වරදක් ම;

(ආ) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට හෝ (ආ) ඡේදයට හෝ (ඇ) ඡේදයට හෝ (ඈ) ඡේදයට හෝ (ඉ) ඡේදයට හෝ (ඊ) ඡේදයට හෝ (උ) ඡේදයට අදාළවන තාක් දුරට, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ සෑම වරදක් ම ;".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.